**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**Police Media Division – Forwarding of Important Information to the Media**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ඇඹිලිපිටිය පොලිස් වසම.

2026.05.10 දින අළුයම ඇඹිලිපිටිය පොලිස් වසමේ කොඩිකන්ද ප්‍රදේශයේ පුද්ගලයෙකු මොට ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට ඇඹිලිපිටිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 52 ක් වූ කොඩිකන්ද, ඇඹිලිපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා තවත් පුද්ගලයින් දෙදෙනෙකු අතර ඇති වූ ආරවුලක් දුරදිග යාම හේතුවෙන් යකඩ පොල්ලකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඇඹිලිපිටිය පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## Murder – Embilipitiya Police Division

Investigations have been initiated by the Embilipitiya Police Station following a report received in the early hours of 10 May 2026 that a person had been fatally assaulted with a blunt object in the Kodikanda area within the Embilipitiya Police Division.

The deceased, a 52-year-old resident of Kodikanda, Embilipitiya, was found to have sustained fatal injuries consistent with an attack involving an iron rod.

Preliminary investigations have revealed that the incident occurred following a dispute between the victim and two other individuals, during which the assault was carried out.

The Embilipitiya Police are conducting further investigations to apprehend the suspects.

## 02. සැක කටයුතු මරණයක් - වෙල්ලාවලි පොලිස් වසම.

2026.05.10 දින සවස වෙල්ලාවලි පොලිස් වසමේ සින්නවත්ත ප්‍රදේශයේ කුඹුරු ඉඩමක් තුල පුද්ගලයෙකු සැක කටයුතු ලෙස මියගොස් සිටින බවට වෙල්ලාවලි පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු අවුරුදු 53 ක් වූ සින්නවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2026.05.08 දින සිට අතුරුදන් වී සිටි පුද්ගලයෙකු බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

වෙල්ලාවලි පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### Suspicious Death – Wellawaya Police Station Division

On the evening of 10 May 2026, the Wellawaya Police Station initiated investigations following a report of a suspicious death in a paddy field in the Sinnawatte area of the Wellawaya Police Division.

The deceased is a 53-year-old resident of the Sinnawatte area.

Ongoing investigations have revealed that the deceased had been reported missing since 8 May 2026 prior to the discovery of the body.

Further inquiries are being conducted by the Wellawaya Police.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.

2026.05.10 දින සවස ගල්කිස්ස පොලිස් වසමේ අත්තිඩිය, කහවිට ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 76 මිලිග්‍රෑම් 100 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 29 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### Arrest for Possession of “Ice” Narcotics – Police Special Task Force Jayawardenapura Camp

On the evening of 10 May 2026, officers from the Police Special Task Force Jayawardenapura Camp conducted a raid in the Kahawita area of the Attidiya Police Division under Mount Lavinia jurisdiction and arrested a suspect in possession of 76 grams and 100 milligrams of crystal methamphetamine (“Ice”).

The suspect, a 29-year-old resident of Dehiwala, was handed over to the Mount Lavinia Police Station for further investigations.

## 04. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2026.05.10 දින දහවල් මීගමුව පොලිස් වසමේ දළුපොත ප්‍රදේශයේදී මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 75 ක් (බෝතල් 100) සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 50 ක් වන දළුපොත, මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

## Arrest for Possession of Illegal Liquor – Negombo Divisional Crime Investigation Bureau

On the afternoon of 10 May 2026, officers from the Negombo Divisional Crime Investigation Bureau conducted a raid in the Dalupotha area of the Negombo Police Division and arrested a suspect in possession of 75 litres (100 bottles) of illicit liquor.

The suspect is a 50-year-old resident of Dalupotha, Negombo.

Further investigations are being carried out by the Negombo Police.

## 05. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව දිස්ත්‍රික් (1) වැටලීම් කණ්ඩායම.

2026.05.10 දින රාත්‍රී මීගමුව පොලිස් වසමේ කට්ටුව ප්‍රදේශයේදී මීගමුව දිස්ත්‍රික් (1) වැටලීම් කණ්ඩායමේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 135 ක් (බෝතල් 180) ක් හා නීති විරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 180 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගමුව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු අවුරුදු 57 ක් වන කට්ටුව, මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

## Arrest for Large-Scale Illicit Liquor Operation – Negombo Police Station Division

On the night of 10 May 2026, officers of the Negombo District (1) Raid Team conducted a raid in the Kattuwa area of the Negombo Police Division and arrested a suspect in possession of 135 litres (180 bottles) of illicit liquor and 180 litres of fermented wash (“Goda”) used in alcohol production.

The suspect is a 57-year-old resident of Kattuwa, Negombo.

Further investigations are ongoing under the supervision of the Negombo Police.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

**Police Media Division**